# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.16 පැය 1655 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/618 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධව - කොළඹ අපරාධ කොට්ඨාසය.**

කොළඹ අපරාධ කොට්ඨාසයට ලද තොරතුරක් මත එම කොට්ඨාසයේ නිලධාරින් කණ්ඩායමක් විසින් කැස්බෑව ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබා ගත් සෝදිසි වරෙන්තුවක් ප්‍රකාරව 2026.04.16 දින උදෑසන පිළියන්දල පොලිස් වසමේ මාම්පේ ප්‍රදේශයේ පිහිටි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නිවසක් පරික්ෂාවට ලක් කර ඇත. එම පරික්ෂා කිරිමට අදාලව පහත සඳහන් අවි ආයුධ සමඟ එම මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇත.

- ජීව අත්බෝම්බයක්
- ටී 56 වර්ගයේ මැගසින් දෙකක්
- ටී 56 ජීව පතරොම් 221 ක්
- 0.22 වර්ගයේ පතරොම් 103 ක්
- 84S වර්ගයේ ජීව පතරොම් 31 ක්
- මන්ත්‍රීවරයාට අයත් වගා ඉඩමක් සඳහා නිකුත් කර තිබූ බෝර 12 වර්ගයේ ගිණි අවියක් ගිනි අවියක්

සැකකරු 2026.04.16 දින කැස්බෑව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරිමට නියමිතව ඇති අතර කොළඹ අපරාධ කොට්ඨාසය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**